# අයවැය කථාව
# 2015

නැගෙනහිර පළාත් සභාව
ත්‍රිකුණාමලය.

**ගරු සභාපතිතුමියනි,**

නැගෙනහිර පළාත් සභාවේ 2015 වර්ෂය සඳහාවූ අයවැය යෝජනාව අද දින ගරු සභාවට ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම ඉමහත් සතුටට පත්වෙමි.

"මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ජාතික ප්‍රතිපත්තිය, " මධ්‍යකාලීන සංවර්ධන රාමුව" හා "නැගෙනහිර පළාත් සංවර්ධන සැලැස්ම" ආදිය පදනම්කරගෙන සකස්කරනු ලබන වාර්ෂික වැඩසටහන් මගින් නැගෙනහිර පළාත කඩිනම් සංවර්ධනයකින් යුතුව නැගීසිටිමින් නව ඉලක්කයන් කෙරෙහි ළඟා වීමට මහත් පරිශ්‍රමයක් දරයි.

මෙයට ජාතික මට්ටමේ මගපෙන්වීම් හා අනුග්‍රහදැක්වීම් හා අප තුළ පැවති යහපාලනය, ඉහළ ඵලදායීතාවයක් ඇති වැඩසටහන්, කැපවීමෙන් යුතුව කටයුතු කිරීම හා අගනා මගපෙන්වීම තුළින් අප පළාත සමාජ ආර්ථික වර්ධනයේ ඉහළ ප්‍රගතියක් ලබාගෙන ඇතිබව සිහිපත් කරන අතර අප පළාත පහසුවෙන්ම සෞභාග්‍යය උදාකරගන්නා බව මම තරයේ විශ්වාස කරමි.

## පළාත් සංවර්ධනය

නැගෙනහිර පළාත විශාල භූමි ප්‍රදේශයක පැතිරී ඇති හෙයින් ක්ෂේත්‍ර ගණනාවකින්ම සමෘද්ධිමත් වීම පිළිබඳව අපි සාඩම්බරයට පත්වෙමු.

අප පළාත ප්‍රාදේශීය මට්ටමින් කඩිනම් සංවර්ධනයකට ලක්වන අතර රටේ සමාජ ආර්ථික වර්ධනයටද සැලකියයුතු දායකත්වයක් දක්වයි. දළ ජාතික නිෂ්පාදිතයට 6.3% ක දායකත්වයක් ලබාදෙමින් පළාත් මට්ටමින් 5 වන ස්ථානයට පත්ව සිටී. එමෙන්ම පළාත් මට්ටමේ සමාජ ආර්ථික දර්ශකද ජාතික දර්ශකවලට නොදෙවෙනි ආකාරයෙන් පවත්වාගෙන යනු ලැබේ.

අප පළාතට සුවිශේෂ වූ අවශ්‍යතා, සම්පත්, කුසලතාවයන් ආදිය මැනවින් භාවිතාකරමින් නැගෙනහිර පළාත් සංවර්ධන ක්‍රියාවලිය උද්වේගයෙන් යුතුව ක්‍රියාත්මක වීම මෙයට ප්‍රධානතම හේතුවයි. මෙම ප්‍රතිඵල ළඟාකරගැනීමට නන් අයුරින් උපදෙස් හා සහයෝගය දක්වන ගරු ආණ්ඩුකාර තුමා, පළාත් සභා නිලධාරීන්, සෙසු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ ආයතන ආදියෙහි දායකත්වය ගෞරවයෙන් සිහිපත් කරන අතර ඉදිරි වර්ෂවලදීද එය තවදුරටත් ඉටුවන බව මම තරයේ විශ්වාස කරමි.

පළාතේ දිගු කාලීන සංවර්ධනය අරමුණු කරගෙන සම්පාදනය කරන ලද නැගෙනහිර පළාත් සංවර්ධන සැලැස්ම හා පස් අවුරුදු ආයතනික ප්‍රතිඵල

රාමුව ඔස්සේ පළාතේ සියලු සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකරමින් අපගේ ඉලක්ක කරා ළඟාවීමට යහපත් ඉදිරිගමනක යෙදී සිටිමු.

## මූල්‍ය ප්‍රතිපාදන

2015 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාව විසින් නැගෙනහිර පළාත් සභාවට පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 16,465 ක්ද ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 2,869 ක්ද වෙන්කර ඇත. විදෙස් මූල්‍යාධාර මගින් විශේෂ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාග්ධන වියදමින් රුපියල් මිලියන 1,279 ක් වෙන් කර තිබේ. 2014 වසර හා සසඳන කළ පුනරාවර්තන වියදම් රුපියල් මිලියන 1,455 කින්ද, පළාත් සභාව සඳහාවන ප්‍රාග්ධන දීමනාව රුපියල් මිලියන 250 කින්ද වැඩිවී ඇත.

පුනරාවර්තන වියදම් සඳහාවන මුදල් යෙදවීම් සඳහා මධ්‍යම රජයේ ප්‍රදානයෙන් රුපියල් මිලියන 13,750 ක්ද රජයේ ආදායම් එක්රැස් කිරීම් හරහා රුපියල් මිලියන 2,715 ක්ද ලැබේයයි අපේක්ෂාකෙරේ. අප පළාත් සභාවේ ආදායම් එකතුකිරීම් රුපියල් මිලියන 740 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

මුළු ප්‍රාග්ධන වියදමින් 54% ක් ප්‍රජා යටිතල පහසුකම් සඳහාද 13% ක් ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය සඳහාද 09% නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහාද 05% ක් පළාත් පාලන සේවා සඳහාද ආයෝජනය කරනු ලබන අතර පළාත් පරිපාලන ආයතනික සංවර්ධනයට 10% ක්ද වෙන්කර ඇත.

තවද විශේෂ වැඩසටහන් ලෙස ප්‍රාදේශිය සංවර්ධනය තුලනය කිරීමේ අරමුණින් මෙම වසරේ ආරම්භ කරන ලද කුඩා කර්මාන්ත කලාප ඉදිකිරීමේ ව්‍යාපෘතියේ අවිච්ඡේද වැඩකටයුතු සඳහා රුපියල් මිලියන 76 ක් ඉදිරි වසර සඳහා වෙන්කරන ලදී. මෙම ව්‍යාපෘතිය තවදුරටත් කෘෂිකර්ම හා කුඩාකර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ සිදුකරනු ලැබේ.

එසේම ඉදිරි වසරේදී නොදියුණු ගම්මාන සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 60 ක්ද වෙන්කර ඇති අතර ඒ සඳහා වන ව්‍යාපෘති ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩසටහනට ඇතුළත් කර ක්‍රියාත්මක කරනු ලැබේ.

තවද ගරු පළාත් සභා නියෝජිතවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා එක් එක් පළාත් සභා මන්ත්‍රීවරයාට ලබාදෙන මුදල රුපියල් මිලියන 3 දක්වා වැඩිකර ඇති අතර මේ සඳහා මුළුමනින්ම රුපියල් මිලියන 111 ක් වෙන්කරන ලදී. මෙම මුදල් ප්‍රතිපාදනය කිරීමේදීජනතාවට යහපත් ප්‍රතිඵල ලැබෙන වඩාත් යෝග්‍යවන ව්‍යාපෘති

තෝරාගෙන පළාත් සංවර්ධනයට මඟ හෙළිපෙහෙළි කරදෙන ලෙස ඉල්ලා සිටිමි.

නැගෙනහිර පළාත් සභාවේ සංවර්ධන ප්‍රතිපත්තිවලට අනුකූලව සංවර්ධන ආයෝජන හා ප්‍රතිලාභ උදාකරදීමේදී ප්‍රාදේශීය වශයෙන් හා ජාතීන් සියල්ලටම එම ප්‍රතිලාභ ලැබීමට සැලැස්වීම අපගේ වගකීම වේ. ඒ අතර සියලු ක්ෂේත්‍රවල සියලු ක්‍රියාකාරකම්වලදී ප්‍රාදේශීය හා ජාතීන් වශයෙන් තුලනයක් නොකඩවා පවත්වාගෙන යාම හා හඳුනාගත් පසුගාමී ගම්මාන සඳහා වැඩි අවධානයක් යොමුකරන බවට අපි සහතික වෙමු.

සංවර්ධනය තවදුරටත් දිරිගැන්වීම සඳහා අදාල ක්ෂේත්‍රවල රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ දායකත්වය තුළින් ඵලදායී ව්‍යාපෘති ක්‍රියාත්මක කර පළාතේ ජනතාවට ප්‍රතිලාභ අත්වන යාන්ත්‍රණයක් කෙරෙහි අප තවදුරටත් අවධානය යොමු කළ යුතුය. මෙවැනි සංවර්ධන උපායයන් මගින් භෞතික සම්පත් හා මානව සම්පත් භාවිතා කරමින් කර්මාන්ත ක්ෂේත්‍රයන් ව්‍යාප්ත කරමින් නිෂ්පාදනය ඉහළනැංවීම, රැකියා අවස්ථා වැඩිකිරීම, ආදායම් ඉහළනැංවීම ආදිය මගින් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළනැංවීම අපගේ අරමුණ වේ.

අපගේ සංවර්ධන ප්‍රතිපත්ති, උපායමාර්ග, ප්‍රමුඛතා ව්‍යාපෘති ආදිය සාර්ථක ව්‍යුහයක් මගින් පූර්ණවශයෙන් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා කැපවීමෙන් ක්‍රියාකරමු.

## නිෂ්පාදන ක්ෂේත්‍රය

ගරු සභාපතිතුමියනි,

අප පළාතේ ආර්ථිකයට හා ජනතාවගේ ජීවනෝපාය සඳහා කෘෂිකර්මයෙන් විශාල දායකත්වයක් ලැබෙන අතර දිවයිනේ දළ ජාතික නිෂ්පාදිතයටද නැගෙනහිර පළාත විශාල දායකත්වයක් දක්වයි. එසේම කර්මාන්ත ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා අවශ්‍ය සම්පත් හා නිපුණතා සපිරුණු පළාතක් ලෙස අප පළාත ප්‍රකටය.

නැගෙනහිර පළාතේ වගාකළ හැකි බිම් ප්‍රමාණයේ සම්පූර්ණයෙන්ම වී වගා කර ඇති අතර 2013 වසරේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 1.071 ක් ලෙස වැඩිවී ඇත. එසේම වෙනත් ආහාර භෝග නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 97,000 ක් ලෙස හා කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 74 ක් ලෙස වැඩි වී ඇත.

අප පළාතේ විශාල පශු සම්පතක් පවතින බැවින් ඒවායෙහි ඵලදායීතාවය ඉහළ නැංවීමට හා වෙළඳපොළ අවස්ථා ඇතිකරදීමටත් සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති අතර කිරි හා ගොවිපොළ නිෂ්පාදන ඉහළනංවා එක් ලාභදායී ක්ෂේත්‍රයක් බවට පත් කළ යුතුය.

කෘෂිකර්ම හා කර්මාන්ත යන නිෂ්පාදන ක්ෂේත්‍ර තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා මෙම ක්ෂේත්‍රවල නියුතු පවුල්වල ජීවන මට්ටම ඉහළ නැංවීමට උපායයන් සකසා ඊට සුදුසු ක්‍රියාකාරකම් අපගේ වැඩසටහන්වලට ඇතුළත් කරනු ලැබේ. මෙම ක්ෂේත්‍රවල වැඩිවශයෙන් ජීවනෝපාය වශයෙන් සිදුකරන කටයුතු ආර්ථික වටිනාකමක් ඇති ව්‍යවසායකත්ව උත්සාහයන් බවට පත් කළ යුතුය. අප පළාතේ නිෂ්පාදනවලට අගයඑකතු කිරීම් කටයුතු ක්‍රියාත්මක කර ව්‍යාපාර උත්සාහයන් දිරිගැන්වීමේ හා අළෙවිකරණ පහසුකම් වැඩිදියුණු කිරීම කෙරෙහිද අපගේ වැඩි අවධානයක් යොමු කර ඇත්තෙමු.

කෘෂිකර්ම ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම හා එහි ඉලක්ක හා වැඩසටහන් ආදිය සලකාබලමින් කෘෂිකර්ම යටිතල පහසුකම් සංවර්ධනය යටතේ කෘෂිකර්ම මාර්ග දියුණු කිරීම හා වාරිමාර්ග ක්ෂේත්‍රයේ ව්‍යාප්තියද සිදුකරනු ලැබේ.

ධීවර සම්පත් ප්‍රමාණවත් අයුරින් පිහිටා ඇති අප පළාතෙහි මත්ස්‍ය උත්පාදනයද 2013 වසරේදී මෙට්‍රික් ටොන් 9,290 ක ඉලක්කයට ළඟා වී ඇත. එසේ වුවද පවතින සම්පත් හා සැසඳීමේදී මත්ස්‍ය නිෂ්පාදනය හා ඊට සම්බන්ධ අනෙකුත් කටයුතුද තවදුරටත් දිරිගැන්විය යුතුය. නවීන තාක්ෂණය උපයෝගී කරගෙන කාර්යක්ෂමතාවයෙන් යුතු මත්ස්‍ය නිෂ්පාදනය හා අළෙවිය වැඩිදියුණු කිරීම හා අගය එකතු කිරීම සහ අපනයන ව්‍යාපාරය ආදිය පිළිබඳව අවධායනය යොමුකළ යුතුය. ජීවනෝපාය ක්‍රියාමාර්ග පිළිබඳව සැලකීමේදී දුප්පත් ධීවරයින් සඳහා යෙදවුම් ලබාදීමේ වැඩසටහන් සහ සුළු පරිමාණ යටිතලපහසුකම් සකසාදීම නොකඩවා සිදුකරනු ලැබේ.

අප පළාතේ ප්‍රාදේශීය සම්පත්, ජනතාවගේ රැකියා නිපුණතා මෙන්ම වෙළඳපොළ අවස්ථා ආදිය කේන්ද්‍රගතකොට නවීන තාක්ෂණය සමගින් සුළු කර්මාන්ත ක්ෂේත්‍රය ව්‍යාප්ත කිරීම මගින් ප්‍රාදේශීය සම්පත් නියමාකාරයෙන් භාවිතකොට ග්‍රාමීය රැකියා අවස්ථා වැඩිකර දිළිඳු පවුල් වෙනුවෙන් ස්ථාවර ආදායම් මාර්ගයක් ඇතිකරදීම සඳහා වැඩසටහන් සකස්කර ක්‍රියාත්මක කළ යුතුය.

නැගෙනහිර පළාතේ සංචාරක ක්ෂේත්‍රයද ප්‍රමාණවත් සම්පත් සහිතව වේගවත් සංවර්ධනයකට ලක්වෙමින් පවතින අතර ඒ හා සම්බන්ධ රැකියා හා සේවා සමග ඒකාබද්ධ වෙමින් පෞද්ගලික අංශයේද දායකත්වයෙන් මෙම ක්ෂේත්‍රය තවදුරටත් ඉදිරියට ගෙනයා යුතුය. මේ සඳහා හඳුනාගත් විභව්‍ය ස්ථානවල සුළු හා මධ්‍යම පරිමාණයේ යටිතල පහසුකම් වැඩසටහන්, සහායක සේවා හා වෙළඳපොළ පහසුකම් පළාත් මූල්‍ය ව්‍යාපෘති ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක

කරන්නෙමු. එසේම අප පළාතේ සංචාරක ක්ෂේත්‍රය වැඩි ආදායම් උපයන ක්ෂේත්‍රයක් බවට පත්කිරීමට අපි මගහෙළිකරන්නෙමු.

ධාන්‍යාගාරය ලෙස හැඳින්වෙන අප පළාතේ ආර්ථිකයෙහි කොඳු නාරටිය වන නිෂ්පාදන ක්ෂේත්‍රය තවදුරටත් දිරිගන්වා එමගින් සමාජ සංවර්ධනය ළඟාකරගැනීම අරමුණුකරගෙන අප ක්‍රියාත්මක විය යුතුය. ඒ සඳහා උපායමාර්ග හා ක්‍රියාමාර්ග අදාල දෙපාර්තමේන්තුවල වැඩසටහන්වලට ඇතුළත් කර ක්‍රියාවට නැංවිය යුතුය.

නිෂ්පාදන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් හා ක්‍රියාමාර්ග අදාල දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වසරේ රුපියල් මිලියන 263 ක් ප්‍රාග්ධන වියදම් ලෙස පළාත් අරමුදලින් වෙන් කර ඇත.

## ආර්ථික යටිතල පහසුකම්

පසුගිය වසරවලදී අප පළාතේ දිස්ත්‍රික්ක තුනෙහිම සුළු හා මහා පරිමාණයේ ආර්ථික යටිතල පහසුකම් ව්‍යාපෘති සකස්කර නැගෙනහිර පළාත් සභාව මගින් හා ජාතික ආයතන මගින් ක්‍රියාත්මක කර නිමකරන ලදී. ඒ යටතේ මහාමාර්ග, පාලම් හා පළාත් ග්‍රාමීය මාර්ග පද්ධතිය දියුණුකර ඇති අතර විදුලි පහසුකම්, ජල සම්පාදන, විදුලිසංදේශ හා ගමනාගමන සේවා ආදියද ව්‍යාප්ත කර ඇත.

තවද පළාතේ ජනතාවගේ මූලික පහසුකම් දියුණුකිරීම සඳහා නිවාස ඉදිකිරීම් ක්ෂේත්‍රය දියුණුකිරීමේ අරමුණින් හා ඒ සඳහා විශේෂ ආයතනයක අවශ්‍යතාවය තේරුම්ගෙන නැගෙනහිර පළාත් නිවාස අධිකාරිය පිහිටුවා ඇත. එමගින් සැපයෙන සේවා කාර්යක්ෂමව ක්‍රියාත්මක වන අතර පළාත් සංවර්ධනයේ නිවාස ඉදිකිරීම් සඳහා දායකත්වය සපයයි.

මෙවැනි යටිතලපහසුකම් ව්‍යාප්තිය ප්‍රාදේශීය සමාජ ආර්ථික සංවර්ධනයට මගහසර ලබාදෙන අතර එහි ප්‍රතිඵල ජනතාව භුක්ති විඳිති. සංවර්ධන දර්ශක ඉහළනැංවීම සඳහා යටිතලපහසුකම් ක්ෂේත්‍රයේ වැඩිපුර ආයෝජන හා සැලසුම් සිදුකළයුතුය. ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අපගේ පළාත් සභාව තවදුරටත් කැපවීමෙන් ක්‍රියාකරයි.

ආර්ථික යටිතලපහසුකම් ව්‍යාපෘති සඳහා මධ්‍යම රජයේ හා විදේශාධාර ව්‍යාපෘතිවලින් විශාල ආයෝජන සිදුකරනු ලැබේ. ඉදිරි වසරවලදී එවැනි සංවර්ධන ආයෝජන වැඩිකිරීම හා වඩාත් ඵලදායී ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කර අවසන් කිරීම පිළිබඳව වැඩි අවධානයක් යොමුකළ යුතුය. එසේම සංවර්ධනය සඳහා ලැබෙන පළාත් අරමුදල භාවිතයේදී අත්‍යාවශ්‍ය හා

ප්‍රමුඛතාගත සාර්ථක වැඩසටහන් සකස්කර ජනතාවට සෙත සැලසෙන ආකාරයෙන් ක්‍රියාත්මක කළ යුතුය.

උපක්ෂේත්‍ර කිහිපයක්ද ඇතුළත්වන පරිදි 2015 වසර සඳහා ආර්ථික යටිතලපහසුකම් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 379 ක් ප්‍රාග්ධන වියදම් ලෙස පළාත් දෙපාර්තමේන්තුවලට වෙන්කර ඇත.

## ප්‍රජා යටිතල පහසුකම් සහ සේවා

ගරු සභාපතිතුමියනි,

අප පළාත් සභා ව්‍යුහයේ හා එහි මුදල්, පරිපාලන හා සංවර්ධන ක්‍රියාකාරකම්වලදී අධ්‍යාපන හා සෞඛ්‍ය ආදිය ඇතුළත් ප්‍රජා යටිතලපහසුකම් හා සේවා අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම ප්‍රධාන අංශ දෙකෙහිම පසුගිය වර්ෂවල සිදුකළ සංවර්ධන ආයෝජන, සේවා ව්‍යාප්ත කිරීම්, සේවක සංඛ්‍යා ව්‍යාප්ත කිරීම්, නවීන කර්මාන්ත ක්‍රමවේද හඳුන්වාදීම ආදිය මගින් මානව සම්පත් සංවර්ධනයේ ඉහළ මට්ටමකට ළඟාවී සිටින්නෙමු.

අධ්‍යාපනය හා සෞඛ්‍ය යන ක්ෂේත්‍ර දෙකෙහි සංවර්ධන ආයෝජන යනු ප්‍රාග්ධන වියදමක් ලෙස පමණක් නොව සේවා ලබාදීම ලෙස සලකා බැලීමේදී පුනරාවර්තන වියදමක් ලෙසද සැලකිය හැකිය. අධ්‍යාපනය හා දේශීය වෛද්‍ය අංශයද ඇතුළත් වන සෞඛ්‍ය යන ක්ෂේත්‍ර දෙක සඳහාම ඉදිරි වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානයෙන් රුපියල් මිලියන 454 ක් ප්‍රාග්ධන වියදම් ලෙස වෙන්කර ඇති අතර මෙම අංශ යටතේ එන විශේෂ ව්‍යාපෘතිද සියලු උප අංශයන්ද ඇතුළත්වන පරිදි ප්‍රජා යටිතලපහසුකම් සේවා සඳහා රුපියල් මිලියන 1,538 ක් ප්‍රාග්ධන වියදම් ලෙස පළාත් දෙපාර්තමේන්තු සඳහා වෙන්කර ඇත.

ප්‍රධාන වශයෙන් අධ්‍යාපන හා සෞඛ්‍ය යන ක්ෂේත්‍රයන් යටතේ පසුගිය වසරවල ආරම්භ කර තවමත් අවසන් නොකළ තත්වයේ පවතින ගොඩනැගිලි විශාල ප්‍රමාණයක් දක්නට ලැබෙන අතර ඒවා සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මගින් දෙපාර්තමේන්තු යටතේ ප්‍රමුඛතා පිළිවෙළ මත ප්‍රමාණවත් මුදල් වෙන්කර සම්පූර්ණ ගොඩනැගිලි ලෙස ජනතාවට හා ශිෂ්‍යයන්ට භාවිතය සඳහා හැකි ඉක්මනින් ලබාදිය යුතුය.

මෙම ක්‍රියාමාර්ග සියලු අංශයන් යටතේ ඉදිරි වසරවල වැඩසටහන් මගින් ප්‍රමුඛතාගත කර සම්පූර්ණ කරනු ලබන අතර මෙවැනි තත්ත්වයන් ඉදිරිකාලයේදී ඇතිනොවන පරිදි ආංශයික වැඩසටහන් සකස්කර එම

වසරවලදීම අවසන්කර ඒවා සම්පූර්ණයෙන්ම භාවිතාකළහැකි තත්ත්වයට පත්කළ යුතුය.

පාසැල් මට්ටමින් සෞඛ්‍ය, ක්‍රීඩා, තොරතුරු තාක්ෂණය, ඉගැන්වීම් හැකියා මෙන්ම අධ්‍යාපන කළමනාකරණය ආදිය කෙරෙහි අවධානය යොමු කොට ඒකාබද්ධ සංවර්ධනය ඇතිකරගැනීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැඩසටහන් සකස්කර ක්‍රියාත්මක කරනු ලැබේ.

අධ්‍යාපන සංවර්ධනය සඳහා ඊළඟ වසරේදී පළාත් සංවර්ධන ප්‍රදානයෙන් රුපියල් මිලියන 208 ක් හා විශේෂ ව්‍යාපෘති මුදලින් රුපියල් මිලියන 397 ක්ද වෙන්කර ඇත. විශේෂයෙන්ම සංස්කෘතික උරුමයන් ආරක්ෂාකිරීමේ අරමුණින් පළාත් සංස්කෘතික කෞතුකාගාරයක්ද අලුතින් ඉදිකරන ලදී.

පළාත් සෞඛ්‍ය දර්ශක ජාතික මට්ටමේ දර්ශක හා සංසන්දනය කළ හැකි පරිදි සාධනීය මට්ටමක ඇති බව පෙන්වා දිය හැකිය. තවද අපගේ ජනතාවට ගුණාත්මක සෞඛ්‍ය සේවාවන් ලබාදීමට හා නිරෝගිමත් සමාජයක් බිහිකිරීමට ආයතන මට්ටමින් යටිතල පහසුකම් ඉහළනංවා සෞඛ්‍ය සේවාවන් ව්‍යාප්ත කිරීම මගින් සුදුසු ක්‍රියාමාර්ග වැඩසටහන්වලට ඇතුළත් කරනු ලැබේ. සියලු ප්‍රදේශවල සියලුදෙනාට ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් පහසුවෙන් ලබාගැනීමට හැකිබවට තහවුරුකිරීම අපගේ මූලික වගකීම වේ.

ඉහළ ගුණාත්මකභාවයකින් යුත් සෞඛ්‍ය පහසුකම් හා සේවාවක් සියලුදෙනාටම අඛණ්ඩව ලබාදීමේ අරමුණින් බටහිර හා දේශීය වෛද්‍ය අංශවල යහපත් සම්බන්ධතාවයක් පවත්වාගනිමින් වැඩසටහන් සකස්කොට ක්‍රියාත්මක කරනු ලැබේ. එසේම සෞඛ්‍ය සේවා ලබාදීමේදී පෞද්ගලික අංශයේ දායකත්වයද වැඩිකරනු ලැබේ.

සෞඛ්‍ය අංශයේ සංවර්ධනය සඳහා ඊළඟ වසරේ සංවර්ධන ප්‍රදානයෙන් රුපියල් මිලියන 246 ක් හා විශේෂ ව්‍යාපෘති මගින් රුපියල් මිලියන 595 ක් වෙන්කර ඇත.

ප්‍රජා ආරක්ෂාව හා අවධානමට ලක්වසිටින්නන් පිළිබඳ සුබසාධන කටයුතු අපගේ සමාජ සේවා ව්‍යාපෘති මගින් සාර්ථකව ක්‍රියාත්මක කෙරෙන අතර ක්‍රීඩා සංවර්ධනය මගින් ජනතාව රෝගවලින් මුදවාගනිමින් සෞඛ්‍යසම්පන්න ප්‍රජාවක් බිහිකිරීමටද අපගේ අවධානය යොමු වී ඇත.

## විශේෂ ව්‍යාපෘති

පළාත් සභා මුදලින් ක්‍රියාත්මකවන වැඩසටහන් වලට අමතරව මධ්‍යම රජයේ ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳව හා පළාත් සභා ආයතන මගින් විදේශාධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන විශේෂ ව්‍යාපෘති පිළිබඳව ප්‍රකාශ කිරීම වැදගත් යයි මම විශ්වාස කරමි.

පසුගිය කාලයේ විදේශ මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක වී වර්ෂාවසානයේදී ඉදිරි වසරට ගෙනයාදැනට සිදුවූ ව්‍යාපෘති සංඛ්‍යාව අනුව සලකාබැලීමේදී මෙම වසරේදී ඉදිරි වසරට ගෙනයාමට ඉතිරි වී ඇති ව්‍යාපෘති සංඛ්‍යාව ඉතා අඩු මට්ටමක පවතී. එමනිසා නව ව්‍යාපෘති හා ඒවාට අවශ්‍ය මූල්‍ය සම්පත් එක්රැස්කිරීමේ පූර්ණ වගකීම අප සතුය.

දෙවන,සෞඛ්‍ය අංශයේ සංවර්ධන වැඩසටහන යටතේ (2nd HSDP) ඉදිරි වසරේදී රුපියල් මිලියන 355 ක් වටිනා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නියමිත බව සතුටින් දැනුම්දෙමි.

දැනට ලෝක බැංකුව, ඕස්ට්‍රේලියානු රජයේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කරනු ලබන පාසැල් අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 397ක් වෙන්කර ඇත. තවද ජපන් අන්තර්ජාතික සහයෝගිතා අරමුදලේ සහයෝගයෙන් මූලික සමාජසේවා යටිතලපහසුකම් සංවර්ධන වැඩසටහනට රුපියල් මිලියන 240 ක්ද ලෝක බැංකුවේ මූල්‍යාධාරයෙන් ක්‍රියාත්මක වන පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 267 ක්ද වෙන්කර ඇත.

## පළාත් පාලන හා ග්‍රාම සංවර්ධන

අප පළාත් සභාව යටතේ පළාත් පාලන ආයතන මගින් පළාත් පාලන මාර්ග, ග්‍රාමීය පොළවල්, ජලය ලබාදීම ආදී යටිතලපහසුකම් මෙන්ම ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය ආදී පළාත් පාලන සේවාද ක්‍රියාත්මක කරනු ලැබේ.

දරිද්‍රතා දර්ශක පදනම්කරගෙන අත්‍යාවශ්‍ය බවට හඳුනාගත් ඉතා දුප්පත් ගම්මානවල සුළු පරිමාණයේ ප්‍රජා යටිතලපහසුකම් සිදුකිරීම සඳහා රුපියල් මිලියන 19 ක් වෙන්කර ඇත. මේවා සියල්ලම ඇතුළත් වන පරිදි පළාත් පාලන හා ග්‍රාමීය සංවර්ධනය සඳහා පළාත් සංවර්ධන ප්‍රදානයෙන් රුපියල් මිලියන 148ක් ප්‍රාග්ධන වියදම් ලෙස වෙන්කරන ලදී.

## යහ පාලනය හා ආයතනික සංවර්ධනය

විවිධ ජාතීන් සහයෝගයෙන් ජීවත් වන අප නැගෙනහිර පළාතේ පළාත් සභා ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් ආදිය ජාතීන් අතර සහයෝගය තවතවත් වැඩිකරන අයුරින් ක්‍රියාත්මක වේ.

මේවායේ විනිවිදභාවය හා වගකීම අප සියලුදෙනාම සතුවන අතර සමානාත්මතාවය තහවුරුකරගන්නා අතරම සංවර්ධනයේදී හා ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය සංවර්ධනය, ජාතීන් අතර සහයෝගය හා ආංශයික දියුණුව ආදිය අතර සමානාත්මතාවය ඇතිකරගනු ලැබේ. අදාල දෙපාර්තමේන්තු මගින් සුදුසු කටයුතු උපරිම මට්ටමින් සිදුකරන බව ප්‍රකාශ කරමි.

සංවර්ධන කටයුතු සඳහා මුදල් වෙන්කිරීමේදී දිස්ත්‍රික් මට්ටමින් තුලිත බව පවත්වාගෙන යාම මෙන්ම දිස්ත්‍රික් තුළද දක්නට ලැබෙන සංවර්ධන පරතරය නැතිකිරීමට සියලු මට්ටම්වලදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. මෙයට සියලුදෙනාගේම පූර්ණ සහයෝගය අවශ්‍ය වන අතර නැවත පදිංචිකළ ජනතාවගේ සුභසාධනය හා අවශ්‍යතා පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුය.

යහපාලනයක් ඇතිකිරීම උදෙසා අනාගතයේදී නැගෙනහිර පළාත් සභාව පළාත් පාලන ආයතන සමග සමීප සම්බන්ධතාවයක් පවත්වාගනිමින් මහජනතාවගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා කැපවීමෙන් ක්‍රියාකරන බවද මෙහිදී ප්‍රකාශ කරමි.

ගරු සභාපතිතුමියනි,

නැගෙනහිර පළාත් සභාවට 2015 වසර සඳහා වෙන්කර ඇති මුදල් සඳහා සකස් කර ඇති මෙම අයවැය යෝජනාව මගින් නැගෙනහිර පළාත් ජනතාවගේ සංවර්ධනයට හා සුභසාධනයට වැඩි අවධානයක් යොමු කරමින් සාර්ථකව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ හා සියලු නිලධාරීන්ගේ පූර්ණ සම්බන්ධීකරණය හා සහයෝගය ඉල්ලා සිටිමින් මාගේ කතාවට සවන්දුන් ඔබ සියලුදෙනාට මාගේ ප්‍රණාමය ප්‍රකාශ කරමින් මාගේ කතාව අවසන් කරමි.

ස්තූතියි

# නැගෙනහිර පළාත් අයවැය වාර්තාව - 2015

| විස්තරය | මුදල් මිලියන රු: |
|---|---|
| **1. ආදායම් මූලාශ්‍රය** | |
| **1.1 පුනාවර්තන වියදම් සඳහා වන මූලාශ්‍රය** | **16,465** |
| *1.1.1 මධ්‍යම ආණ්ඩුව මගින් ලබාදීමට නියමිත සාමුහික ප්‍රදානය* | 13,750 |
| *1.1.2 අපේක්ෂිත පළාත් ආදායම් රැස්කිරීම්* | |
| *මධ්‍යම ආණ්ඩුවේ ආදායම් රැස්කිරීම්* | 1,975 |
| *පළාත් සභාවේ ආදායම් රැස්කිරීම්* | 740 |
| **1.2 ප්‍රාග්ධන වියදම් සඳහා වූ මූලාශ්‍රය** | **2,869** |
| *1.2.1 උපමාන පාදක ප්‍රදාන* | 400 |
| *1.2.2 පළාත් විශේධ සංවර්ධන ප්‍රදාන* | 1,190 |
| *1.2.3 විශේෂ ව්‍යාපෘති ප්‍රදාන* | 1,279 |
| **එකතුව** | **19,334** |
| **2. යෝජිත මුදල් භාවිතය** | |
| **2.1 පුනරාවර්තන වියදම්** | **16,465** |
| *2.1.1 පුද්ගලික පඩිනඩි* | 12,762 |
| *2.1.2 ගමන් වියදම්* | 182 |
| *2.1.3 සැපයීම්* | 472 |
| *2.1.4 නඩත්තු වියදම් සහ ගිවිසුම්ගත සේවා* | 1,091 |
| *2.1.5 මාරුකිරීම්* | 1,720 |
| *2.1.6 ප්‍රදාන, සහනාධාර සහ සෙසු* | 238 |
| **2.2 ප්‍රාග්ධන වියදම්** | **2,869** |
| *2.2.1 ගරු පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සංවර්ධන* | 111 |
| *2.2.2 ආයතන සංවර්ධන හා පළාත් පරිපාලන* | 289 |
| *2.2.3 ක්ෂේත්‍ර සංවර්ධන ව්‍යාපෘතීන්* | |
| - *ආර්ථික යටිතල පහසුකම* | 379 |
| - *සමාජ යටිතල පහසුකම* | 1,538 |
| - *නිෂ්පාදන ක්ෂේත්‍ර*(කෘෂිකර්මික/කාර්මාන්ත) | 263 |
| - *පළාත් පාලනය හා පහසුකම් සැපයීම* | 153 |
| - *සමානාත්මක ප්‍රාදේශිය සංවර්ධන වැඩසටහන* | 76 |
| - *ග්‍රාමීය සංවර්ධන වැඩසටහන* | 60 |
| **මූලය ප්‍රයෝජ්‍යකරණය** | **19,334** |